# නැගෙනහිර පළාත් මාර්ග සංවර්ධන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, නිපුණතා හා මිනිස්බල සංවර්ධන, වනිතා කටයුතු හා ජල සම්පාදන අමාත්‍ය ගරු ඩබ්ලිව්. ජී. එම්. ආරියවති ගලප්පත්ති මැතිතුමියගේ

# 2016 මුදල් වර්ෂය සඳහා වු අයවැය කථාව

නැගෙනහිර පළාත් සභාවේ ගරු සභාපති ඒ. පී. ජී. චන්ද්‍රදාස මැතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍ය හාෆීස් නසීර් අහමඩ් මැතිතුමනි, ගරු අමාත්‍යවරුනි, ගරු විපක්ෂ නායකතුමනි, ගරු පළාත් සභා මන්ත්‍රීවරුනි, නැගෙනහිර පළාතේ ප්‍රධාන ලේකම් ඩී. එම්. සරත් අබේගුණවර්ධන මහතාණෙනි, අමාත්‍යාංශ ලේකම්වරුනි, සභා ලේකම්තුමනි, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුනි, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ ඔබ සැමට ආයුබෝවන්, වනක්කම්.

නැගෙනහිර පළාත් මාර්ග සංවර්ධන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, නිපුණතා හා මිනිස්බල සංවර්ධන, වනිතා කටයුතු හා ජල සම්පාදන අමාත්‍යාංශයේ 2016 වර්ෂයේ අයවැය යෝජනාව මෙම සභාවට ඉදිරිපත් කිරීමට ලැබීම ගැන මා ඉතාමත් සතුටට පත් වෙමි.

මාර්ග සංවර්ධන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, නිපුණතා හා මිනිස්බල සංවර්ධන, වනිතා කටයුතු හා ජල සම්පාදන ආදී වැදගත් ක්ෂේත්‍ර පහක් (05) මාගේ අමාත්‍යාංශයට අයත් වේ. මේ තුළින් මාර්ග සංවර්ධන හා ඉඩම් සංවර්ධන ක්ෂේත්‍රයන් සඳහා වෙන් වෙන් වශයෙන් දෙපාර්තමේන්තු ක්‍රියාත්මක වේ. කෙසේ වෙතත් මෙම ක්ෂේත්‍ර අප අමාත්‍යාංශය යටතේ සෘජුව ක්‍රියාත්මක වෙමින් පවතී.

මෙම අමාත්‍යාංශයට හා ඒ යටතේ පාලනය වන දෙපාර්තමේන්තුවලට 2015 වර්ෂයේ පුනරාවර්තන වියදම්, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG), උපමාන පාදක ප්‍රදාන (CBG), පළාත් සභා මන්ත්‍රිවරුන්ගේ අරමුදල් (Members Fund) හා ලෝක බැංකුව (World Bank) වැනි මුදල් මූලාශ්‍ර මගින් ලැබෙන ප්‍රතිපාදන මගින් එම ව්‍යාපෘති

ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘති මගින් ලැබෙන සියලුම ප්‍රතිලාභ මෙම පළාතේ සියළුම ජන කොටස් සාධුව භුක්ති විඳිමින් සිටින බවද මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිමි.

මෙම මුදල් මූලාශ්‍ර භාවිතා කර මාගේ අමාත්‍යාංශය මගින් හා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තු මගින් සියළුම සංවර්ධන ව්‍යාපෘති පවත්නා වර්ෂයේ සාර්ථකව ක්‍රියාත්මක කර අවසන් වන තත්වයෙන් පවතින බව මෙම ගරු සභාව ඉදිරියේ දන්වා සිටිනු කැමැත්තෙමි. අප අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන සියළුම වැඩසටහන් නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්ක තුන ඒකාබද්ධව සැලසුමකට අනුව සියළුම දිස්ත්‍රික්කවල වෙනස්කමක් නොමැති ලෙස සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරමින් පවතින බව ප්‍රකාශ කරනුයේ අතිමහත් සතුටකිනි.

2015 වර්ෂයේ නැගෙනහිර පළාත් සංවර්ධනය සඳහා මුදල් ප්‍රතිපාදන ලබාදුන් අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාටත්, නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාර ඔස්ටින් ප්‍රනාන්දු මැතිතුමාටත්, නැගෙනහිර පළාත් ප්‍රධාන අමාත්‍ය හාෆීස් නසීර් අහමඩ් මැතිතුමාටත්, ගරු අමාත්‍යවරුන්ටත්, ගරු විපක්ෂනායක හා නැගෙනහිර පළාත් සභා ගරු මන්ත්‍රිවරුන්ටත්, නැගෙනහිර පළාත් මහජනතාව වෙනුවෙන් ස්තූතිය පුද කරමි.

නැගෙනහිර පළාත් මාර්ග සංවර්ධන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, නිපුණතා හා මිනිස්බල සංවර්ධන, වනිතා කටයුතු හා ජල සම්පාදන අමාත්‍යාංශය මගින් නැගෙනහිර පළාත් සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘති හරහා සෑම ක්ෂේත්‍රයකම සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම සඳහා, මටත් මාගේ අමාත්‍යාංශයටත් සහයෝගය ලබා දී නැගෙනහිර පළාතේ මාර්ග සංවර්ධන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, නිපුණතා හා මිනිස්බල සංවර්ධන, වනිතා කටයුතු හා ජල සම්පාදන මගින් ජීවනෝපාය හා සංවර්ධනයට අදාළ සියළු කටයුතු කිරීමට සහයෝගය දැක්වූ සියළුදෙනාටම මාගේ ස්තූතිය පුදකර සිටිමි.

අප අමාත්‍යාංශයේ සාධු පාලනය යටතේ ක්‍රියාත්මක වන වැදගත් ක්ෂේත්‍ර තුනකි. එනම් ජල සම්පාදන, වනිතා කටයුතු, නිපුණතා හා මිනිස් බල සංවර්ධනය යනාදිය වේ.

නැගෙනහිර පළාතේ පානීය ජලය නොමැති ප්‍රදේශවලට ප්‍රතිපාදනය කරනලද මුදල් වලින් සුදුසු ස්ථානවල ආරක්ෂා සහිත පානීය ජල ළිං ඉදිකර අප පළාතේ පානීය ජලය නොමැතිව පීඩා විඳි ජනතාවට  ආරක්ෂාකාරී පානීය ජල පහසුකම් මෙම අමාත්‍යාංශය මගින් සපයා දෙමින් පවතී.

මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන වනිතා කටයුතු සංවර්ධන ක්ෂේත්‍රයද ඉන් එකකි. මෙමගින් පවුලේ ප්‍රධානත්වය දරණ පවුල්වල ජීවනෝපාය අවශ්‍යතා සම්පූර්ණ කිරීම පිණිස මැහුම් මධ්‍යස්ථානයක් පිහිටුවීමට අදාළ කටයුතු කරමින් පවතී. තවද දරිද්‍රතාවයෙන් පසු වන කාන්තාවන්ගේ අවශ්‍යතා හඳුනාගෙන ඔවුන්ට අදාළ ස්වයං රැකියා අවස්ථා ඇති කරලීමේ ක්‍රියාමාර්ග මෙම අමාත්‍යාංශයෙන් ක්‍රියාත්මක වන බව මෙහිදි ප්‍රකාශ කර සිටිමි.

නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්ක තුනෙහිම සිටින රැකියා විරහිත තරුණ තරුණියන්ගේ නිපුණතා සංවර්ධනය කිරීමේ අරමුණින් මෙම අමාත්‍යාංශයේ නිපුණතා හා මිනිස් බල සංවර්ධන ක්ෂේත්‍රය ක්‍රියාත්මකව පවති.මේ මගින් පුහුණුව ලබන තරුණ තරුණියන්ට ස්වයං රැකියාවක් තමන් විසින්ම ආරම්භ කිරීමේ හැකියාව ලබාදීමෙන් නැගෙනහිර පළාතේ සංවර්ධනයට දායක වන බව මෙහිදි ප්‍රකාශ කරමි.

නැගෙනහිර පළාතේ රැස්වීම් හා ජංගම සේවා පවත්වා හානියට පත්ව ඇති මාර්ග හඳුනාගෙන ඇති අතර, ඉඩම් සම්බන්ධ ප්‍රශ්ණ හඳුනාගෙන ඒවාටද විසඳුම් ලබාදීමේ ක්‍රමවේද මෙම අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තු මගින් සිදුකරමින් පවතින බව මේ අවස්ථාවේදි ප්‍රකාශ කර සිටිමි.

# මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව

අප අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් පළාත් මාර්ග හා ග්‍රාමීය මාර්ග යනාදිය විවිධ සංවර්ධන ව්‍යාපෘති මගින් ප්‍රතිසංස්කරණය කර මහජන අයිතියට පවරා දෙනු ලැබේ. මෙම සංවර්ධන වැඩසටහන් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) හා උපමාන පාදක ප්‍රදාන (CBG) සහ විවිධ විශේෂ සංවර්ධන ව්‍යාපෘති මගින් ක්‍රියාත්මක වන බව කිව යුතුය.

මෙම ඉදිකිරීම් වැඩ මගින් ඉතාමත් දුර්වල තත්ත්වයේ පවතින මාර්ග සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කර නැගෙනහිර පළාත් ජනතාවගේ ප්‍රවාහන පහසුකම් වැඩි දියුණු කර ඇති අතර, දීර්ඝකාලීන භාවිතයට සුදුසු පරිදි ප්‍රතිසංස්කරණය කොට ඇත. මේ තුළින් නැගෙනහිර පළාතේ ජනතාවගේ ආදායම් තත්ත්වය දියුණු කර ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ කටයුතු ක්‍රමානුකූලව සිදුවෙමින් පවතින බව දන්වා සිටිමි.

විශේෂ සංවර්ධන වැඩසටහන් ලෙස ලෝක බැංකු මුලාාධාර යටතේ මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මත කොට, අදියර වශයෙන් ජනතා අයිතියට පත් කරනු ලැබේ.

## ලෝක බැංකු මූලාාධාර මගින් ක්‍රියාත්මක වන මාර්ග සංවර්ධන ව්‍යාපෘති

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ හානි වී ඇති බව හඳුනාගත් කි.මී. 56.15 ක් දිග මාර්ග ලෝක බැංකු මුල්‍යාධාර මගින් රුපියල් මිලියන 2259 ක් වියදමින් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිසංස්කරණය කොට අදියර වශයෙන් ජනතා අයිතියට පවරා ඇත. මෙම ව්‍යාපාතියෙහි අවසන් අදියර මෙම වසර තුලදී ක්‍රියාත්මක විය.

# ඉඩම් හා ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තුව

මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තුව මගින් ඉඩම් සඳහා අදාල කළමනාකරණ කටයුතු සිදු කරනු ලැබේ.

එනම් නැගෙනහිර පළාත සතු ඉඩම්, ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉඩම් කච්චේරිය මගින් භාරදීම සඳහා අනුමැතිය ලබාදීම, මෙලෙස ලබාදෙන ලද ඉඩම් සඳහා ඉඩම් බලපත්‍ර සහ සැපයුම් බලපත්‍ර ලබාදෙනු ඇත. එමෙන්ම කොන්දේසි උල්ලංගනය කරන ඉඩම් බලපත්‍ර, සැපයුම් බලපත්‍ර අවලංගු කිරීමේ බලය ද ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තුව සතු බව විශේෂයෙන් ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

තවද රජයේ ඉඩම් නීතිය යටතේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ බැංකු, රැකියා ව්‍යවසායන් ආරම්භ කරන වෘත්තිය ආයතන යනාදියට රජයේ ඉඩම් ලබාදීම, රජයේ ඉඩම් නීතිය යටතේ පවරනු ලබන ඉඩම් වලින් රජයට අයවිය යුතු ආදායම එකතු කිරීම මගින් රජයේ ආදායම වැඩිකිරීමට ප්‍රමුඛ දායකත්වයක් ලබාදෙමින් පවතින බව ඉතා සතුටින් දන්වා සිටිමි.

මේ හැර රජයේ නැවත පදිංචි කිරීමේ වැඩසටහන් වල ඉතා වැදගත් යටිතල පහසුකම් දියුණු කිරීම සිදු කෙරෙමින් පවතින බව මෙම ස්ථානයේ ප්‍රකාශ කිරීමෙහිලා ඉතා සතුටු වෙමි.

# 2015 වර්ෂයේ ප්‍රගතිය

## අමාත්‍යාංශයේ සංවර්ධන කටයුතු

**2015 වර්ෂය සඳහා අප අමාත්‍යාංශයට මූල්‍ය ප්‍රතිපාදන ලෙස රුපියල් මිලියන 85.98 ක් ලැබුණි. ඉන් රුපියල් මිලියන 27.01 ක් ප්‍රාග්ධන වියදම් ලෙසත්, රුපියල් මිලියන 58.97 ක් පුනරාවර්තන වියදම් ලෙසත් සඳහන් කරමි.**
**ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.**

| අනු අංකය | විස්තරය | උපමාන පාදක ප්‍රදාන (CBG) (රු.මි.) | වෙනත් ආධාර | එකතුව (රු.මි.) |
|---|---|---|---|---|
| 01 | අමාත්‍යාංශය | 15 | - | 15 |
| 02 | ජල සම්පාදන | 2 | - | 2 |
| 03 | කාන්තා කටයුතු | 2 | - | 2 |
| 04 | කාන්තා මැහුම් මධ්‍යස්ථානය | - | 4.5 | 4.5 |
| 05 | නිපුණතා සහ මිනිස් බල | 2 | - | 2 |
| 06 | මන්ත්‍රී ප්‍රතිපාදන | 1.51 | - | 1.51 |
| | **එකතුව** | **22.51** | **4.5** | **27.01** |

**අමාත්‍යාංශයේ සෘජු පාලනය යටතේ ක්‍රියාත්මක වන ජල සැපයුම්, වනිතා කටයුතු, නිපුණතා සහ මිනිස්බල සංවර්ධන ක්ෂේත්‍ර මගින් ආර්ථික අපහසුතාවයෙන් පසුවන ජනතාවගේ මූලික අවශ්‍යතා හඳුනාගෙන අමාත්‍යාංශය වෙත ලබාදෙන ලද මුදල් ප්‍රතිපාදනවලට අනුකූලව වැඩසටහන් හඳුනාගෙන ප්‍රමුඛතා පදනම මත සම්පූර්ණ කරමින් පවතී.**

**අප අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම ක්ෂේත්‍ර තුන ඉතාමත් වැදගත් හා ජනතාවගේ අත්‍යාවශ්‍ය අවශ්‍යතාවයන් සම්පූර්ණ කරන ක්ෂේත්‍ර ලෙස හැඳින්විය හැකිය.**

## 01. ජල සම්පාදන

ජල සැපයුම් ක්ෂේත්‍රය අප අමාත්‍යාංශයේ වැදගත් ක්ෂේත්‍රයක් ලෙස පවතී. නැගෙනහිර පළාතේ ජනතාවගේ ආරක්ෂිත පානීය ජල අවශ්‍යතාවය සපුරාලීමේ අරමුණින් මෙම ක්ෂේත්‍රය අප අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙමින් පවතී.

2015 වර්ෂයේ මෙම ක්ෂේත්‍රයට උපමාන පාදක ප්‍රදාන (CBG) යටතේ රුපියල් මිලියන 1.35 ක් වෙන් කර ඇත. මෙම ප්‍රතිපාදන තුළින් පානීය ජල ළිං 27 ක් පළාතේ දිස්ත්‍රික්ක තුනෙහිම ඉදිකර අවසන් කිරීමට අදාළ කටයුතු සිදු කෙරෙමින් පවතින බව ඉතා සතුටින් දන්වා සිටිමි.

ඉහත ප්‍රතිපාදන දිස්ත්‍රික්ක තුනෙන් තෝරාගත් අඩු ආදායම්ලාභී පවුල්වලට පානීය ජල ළිං ඉදිකිරීම පිණිස යොදවා ගැනීමට කටයුතු කර ඇත.
2015 වර්ෂයේ ජනතාවට ලබාදි ඇති පානීය ජල ළිං පිළිබඳ විස්තර දිස්ත්‍රික්ක අනුව පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | එක් ඒකකයකට (රු.) | ළිං සංඛ්‍යාව | මුළු ප්‍රතිපාදන (රු.) |
|---|---|---|---|
| අම්පාර | 50,000.00 | 6 | 300,000.00 |
| මඩකලපුව | 50,000.00 | 4 | 200,000.00 |
| ත්‍රිකුණාමලය | 50,000.00 | 17 | 850,000.00 |
| | එකතුව | 27 | 1,350,000.00 |

## 1.1 පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා ප්‍රතිපාදන

නැගෙනහිර පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ 2015 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අමාත්‍යංශයේ ජලසම්පාදන වැඩසටහන් 11 ක් සමෘද්ධි සහනාධාරලාභීන් හට ආරක්ෂිත පානීය ජල අවශ්‍යතාවය සපුරාලීම පිණිස අම්පාර හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කයන්හි ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සමග ඒකාබද්ධව ජල සම්බන්ධතා ලබාදීමේ කටයුතු ක්‍රියාත්මක කරමින් පවතී.

| දිස්ත්‍රික්කය | ප්‍රතිලාභී සංඛ්‍යාව | ප්‍රතිපාදන | වියදම | අවසන් කළ වැඩ සටහන් | ක්‍රියාත්මක වෙමින් පවතින වැඩ සටහන් |
|---|---|---|---|---|---|
| අම්පාර | 98 | 928,000.00 | 908,272.00 | 4 | 3 |
| ත්‍රිකුණාමලය | 81 | 577,312.00 | 323,423.00 | 2 | 2 |
| **එකතුව** | **179** | **1,505,312.00** | **1,231,695.00** | **6** | **5** |

## 02. වනිතා කටයුතු

වනිතා කටයුතු ක්ෂේත්‍රය අමාත්‍යාංශයේ ඉතා වැදගත් ක්ෂේත්‍රයක් ලෙස දැක්වේ. මධ්‍යම රජය සමඟ ද සම්බන්ධව වනිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙමින් පවතී.

2015 වර්ෂයේ මෙම ක්ෂේත්‍රයට උපමාන පාදක අරමුදල් (CBG) වැඩසටහන යටතේ වනිතා කටයුතු සඳහා රුපියල් මිලියන 2.0 ක් වෙන් කර ඇත. මෙම වර්ෂයට අදාළ එම මුදලින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ස්ථාපිත කිරීමට නියමිත වනිතා මැහුම් මධ්‍යස්ථානයට අවශ්‍ය මහන මැෂින් හා උපකරණ මිළදී ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.

තවද අපගේ ඉල්ලීමට අනුකූලව රුපියල් මිලියන 4.5 ක් වියදමින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ එම වනිතා මැහුම් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමට අදාළ කටයුතු කරමින් පවතී.

## 03. නිපුණතා සහ මිනිස්බල සංවර්ධනය

මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන තවත් ක්ෂේත්‍රයක් වන්නේ නිපුණතා සහ මිනිස්බල සංවර්ධන ක්ෂේත්‍රයයි.

2015 වර්ෂයේ මෙම ක්ෂේත්‍රයට උපමාන පාදක අරමුදල් (CBG) ව්‍යාපාතිය යටතේ රුපියල් මිලියන 2.0 ක් වෙන් කර ඇත. මෙම මුදල් පෙරදැරි කරගෙන දිස්ත්‍රික්ක තුනෙහිම තල් සංවර්ධන මණ්ඩලය මගින් තල් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන පුහුණු පාඨමාලා මාස තුනක කාල පරිච්ඡේදයට අදාලව පුහුණුව ආරම්භ කර සාර්ථකව ක්‍රියාත්මක කෙරෙමින් පවතී.

තවද, මෙම පුහුණු පඨමාලාවට අමතරව සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් දිස්ත්‍රික්ක තුනෙහිම ආර්ථික අපහසුතාවයෙන් පෙලෙන ගෘහමූලික කාන්තාවන්ට හා තරුණියන්ට මැහුම් පාඨමාලාවක් ලබාදීම ආරම්භ කර සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතින බව ඉතා සතුටින් දන්වා සිටිමි.

## 04. අමාත්‍යාංශයේ විශේෂ සංවර්ධන වැඩසටහන්

අමාත්‍යාංශයේ විශේෂ සංවර්ධන කටයුතු සඳහා 2015 වර්ෂයේ උපමාන පාදක ප්‍රදාන යටතේ (CBG) රුපියල් මිලියන 10.0 ක් වෙන් කරන ලදි.

මෙතෙක් දරන ලද වියදම් විස්තර පහත දැක්වේ.

| අනු අංකය | විස්තර | ප්‍රතිපාදන | වියදම |
|---|---|---|---|
| 1 | ප්‍රජා සංවර්ධන | 4,650,000.00 | 3,552,000.00 |
| 2 | සංස්කෘතික සංවර්ධන | 1,500,000.00 | 1,493,000.00 |
| 3 | පාසැල් සංවර්ධන | 1,700,000.00 | 1,074,000.00 |
| 4 | ස්වයං රැකියා ප්‍රවර්ධන | 950,000.00 | 950,000.00 |
| 5 | මාර්ග සංවර්ධන | 1,200,000.00 | 972,000.00 |
| | **එකතුව** | **10,000,000.00** | **8,041,00.00** |

## මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව

මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන තවත් ප්‍රධානතම දෙපාර්තමේන්තුවකි. මෙම දෙපාර්තමේන්තුවට අයත් මාර්ග දුර ප්‍රමාණය කි.මි. 1,098.21 කි.

මෙයින් ත්‍රිකුණාමලය, මඩකලපුව හා අම්පාර දිස්ත්‍රික්කවල පිළිවෙලින් කි.මි. 301.50 ක්, කි.මි. 385.53 ක් හා කි.මි. 411.18 ක් දිග C හා D ශ්‍රේණියේ මාර්ග පිහිටා ඇත.

2015 වර්ෂයේ මෙම දෙපාර්තමේන්තුව සඳහා ප්‍රතිපාදන පහත මූලාශ්‍රවලින් ලැබී ඇත.

1. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - (PSDG)
2. උපමාන පාදක ප්‍රදාන - (CBG)
3. ලෝක බැංකු ආධාර - (World Bank)

එසේම 2015 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලෙස රුපියල් මිලියන 237.5 ක් ලැබුණු අතර, ඉන් රුපියල් මිලියන 74.0 ක් ප්‍රාග්ධන වියදම් ලෙසත්, රුපියල් මිලියන 163.5 ක් පුනරාවර්තන වියදම් ලෙසත් සඳහන් කළ හැකිය.

## 1. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG)

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) මූලාශ්‍ර යටතේ රුපියල් මිලියන 70.0 ක් වෙන් කොට පසුගිය වර්ෂයට අදාළ ගෙවීම් සහ අවිච්ඡේද වැඩ කිසිවක් නොමැති හේතුවෙන් රුපියල් මිලියන 70 සඳහාම නව ව්‍යාපෘති යෝජනා කරන ලදී. මෙම මුදල් දිස්ත්‍රික්ක තුනෙහිම පිහිටි මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට වෙන් කොට දැනට එම වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් පවතී.

### 2015 වර්ෂයේ නොවැම්බර් මස දක්වා ප්‍රගතිය

| දිස්ත්‍රික්කය | ප්‍රතිපාදන (රු.මි.) | නිදහස් කරන ලද අග්‍රිමය (රු.මි.) | මේ දක්වා වූ වියදම් (රු.මි.) |
|---|---|---|---|
| මඩකලපුව | 24.0 | 6.26 | 6.26 |
| අම්පාර | 24.0 | 13.69 | 13.26 |
| ත්‍රිකුණාමලය | 22.0 | 7.00 | 4.82 |
| එකතුව | 70.0 | 26.95 | 24.34 |

මේ යටතේ අම්පාර, මඩකලපුව හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල සංවර්ධනය කරමින් පවතින මාර්ග පිළිබඳ විස්තර පහත දැක්වේ.

# අම්පාර

| මාර්ගයේ නම | මාර්ගයේ දුර (කි. මි.) | කොන්ත්‍රාත් මුදල (රු.මි.) (බදු රහිත) | වියදම් (2015 නොවැම්බර් දක්වා |
|---|---|---|---|
| ඉරක්කාමම් වරිප්පොත්තාන්චේනයි විදිය | 0.5 | 3.00 | 1.68 |
| ජලාපවහන අළුත් වැඩියාව මුංගිලඩි විදිය, සමන්තුරේ | 0.5 | 4.0 | 3.17 |
| පාසල, සමුපකාර විදිය, දමන | 0.2 | 2.0 | 0.69 |
| අන්නමලෙයි නාවින්දන්වෙලි විදිය | 0.1 | 1.5 | 1.16 |
| කාණු පද්ධති අළුත් වැඩියාව, මධ්‍යම විදිය, නින්දවූර් | 0.2 | 3.0 | 0.56 |
| දමන පදගොඩ පල්ලන් ඔය විදිය අළුත් වැඩියාව | 0.3 | 3.0 | 1.86 |
| කාණු පද්ධති ඉදිකිරීම උඩයාර් විදිය, කල්මුණේ | 0.075 | 1.5 | 1.18 |
| ලිහිණියාගම විජේපුර විදිය, දෙහිඅත්තකණ්ඩිය | 0.2 | 2.0 | 1.21 |
| කාණු පද්ධති ඉදිකිරීම (මුහුදු වෙරළ පාර) කල්මුණේ | 0.140 | 2.0 | 0.72 |
| සේනගම විදිය අළුත්වැඩියාව, උහන | 2.6 | 2.0 | 0.39 |
| පරගහකැලේ හිමිදුරවැව මාර්ගය අළුත්වැඩියාව | 3.6 | 1.0 | 0.64 |
| එකතුව | 8.415 | 24 | 13.26 |

# මඩකලපුව

| මාර්ගයේ නම | මාර්ගයේ දුර (කි. මී.) | කොන්ත්‍රාත් මුදල (රු.මි.) (බදු රහිත) | වියදම් (2015 නොවැම්බර් දක්වා |
|---|---|---|---|
| වන්දාරුමූලෙයි අඩෙයිවු බේක් හවුස් විදිය අළුත්වැඩියාව | 1.15 | 1.8 | 1.25 |
| එරාවුර් පුන්නක්කුඩා විදිය ඉදිකිරීම | 1.0 | 5.4 | 0.88 |
| පෝරතිවු, පලුකාමම්, තුම්පන්කේනි විදි අළුත්වැඩියාව (හානියට පත්ව ඇති කොටස්) | 5.81 | 2.4 | 0.46 |
| නැවත ඉදිකිරීම මීරාවෝඩයි, කින්නියඩි පාලම | - | 1.8 | 0.51 |
| රෙපේට්සන් විදිය | 2.0 | 5.0 | 2.97 |
| කලවාන්චිකුඩි කුරුමන්වෙලි තොටුපල විදිය | 0.13 | 1.8 | 0.19 |
| ධීවර විදිය, කාත්තාන්කුඩි අළුත්වැඩියාව | 0.15 | 1.8 | - |
| කුරින්ජාමුනෙයි විදිය, උන්නිච්චෙයි | 0.3 | 4.0 | - |
| එකතුව | 10.54 | 24 | 6.26 |

# ත්‍රිකුණාමලය

| මාර්ගයේ නම | මාර්ගයේ දුර (කි. මී.) | කොන්ත්‍රාත් මුදල (රු.මි.) (බදු රහිත) | වියදම් (2015 නොවැම්බර් දක්වා |
|---|---|---|---|
| කන්තලේ වැන්ඇල පාර | 1.4 | 7.0 | 4.82 |
| වාන්ඇල ආයිල්අඩි විදිය | 2.5 | 15.0 | - |
| එකතුව | 3.9 | 22 | 4.82 |

## 2. උපමාන පාදක ප්‍රදාන (CBG)

උපමාන පාදක ප්‍රදාන (CBG) මුදල් මූලාශ්‍ර යටතේ රුපියල් මිලියන 4.0 ක් වෙන් කර ඇත. මූතූර් ප්‍රදේශයේ ඉදිකරමින් පවතින මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තු උප කාර්යාලයේ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සඳහා ලැබී ඇති මුදල් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට නිදහස් කොට ඇති අතර, ගොඩනැගිල්ලේ ඉදිකිරීමේ කටයුතු කඩිනමින් සිදුවෙමින් පවතී.

## 3. මාර්ග නඩත්තු කිරීම සඳහා ප්‍රතිපාදන (පුනරාවර්තන)- (Recurrent Road Maintenance)

පවත්නා වර්ෂයේ මෙම දෙපාර්තමේන්තුවට මාර්ග නඩත්තු කටයුතු සඳහා රුපියල් මිලියන 115.0 ක් වෙන් කර ඇත. මෙම මුදල අපගේ ප්‍රාදේශීය කාර්යාල අතර පහත සඳහන් පරිදි බෙදා දි ඇත.

| දිස්ත්‍රික්කය | ප්‍රතිපාදනය (රුපියල් මිලියන) | මේ දක්වා වු වියදම් (රුපියල් මිලියන) |
|---|---|---|
| මඩකලපුව | 32.0 | 12.41 |
| අම්පාර | 33.0 | 26.07 |
| ත්‍රිකුණාමලය | 50.0 | 20.84 |
| එකතුව | 115.0 | 59.32 |

ප්‍රාදේශීය මට්ටමින් හඳුනාගන්නා ලද හානි වු මාර්ග මෙම මුදල් මගින් අළුත්වැඩියා කරනු ලැබේ.

## 4. ලෝක බැංකු ආධාර

අම්පාර දිස්ත්‍රික්කයේ ලෝක බැංකු ආධාර යටතේ රුපියල් මිලියන 2.259 ක වියදමින් කි.මි. 56.15 ක දිගු මාර්ග සංවර්ධනය කටයුතු අවසන් කර ජනතා අයිතියට පත් කර ඇත.

### 2015 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා,

- විදේශ ආධාර - රු.මි. 247
- විදේශ මුදල් වියදම් සඳහා වු දේශීය මුදල් - රු.මි. 10.0
- ආපසු ගෙවන විදේශාධාර - රු.මි. 10.0 ක් ද වෙන් කර ඇත.

### පවත්නා වර්ෂයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වෙන් කළ මුදලින්,

- විදේශ ආධාර රු.මි. 187.72
- විදේශ මුදල් වියදම් සඳහා වු දේශීය මුදල් - රු.මි. 3.76
- ආපසු ගෙවන විදේශාධාර - රු.මි. 3.67 ක් ද වියදම් දරා ඇත.

## ලෝක බැංකු මූල්‍ය ප්‍රතිපාදන මගින් ප්‍රතිසංස්කරණය කරනු ලබන මාර්ග පිළිබඳ විස්තර

| අනු අංකය | ව්‍යාපෘතිය | මාර්ගයේ මුළු දිග (කි.මී.) | මාර්ගයේ නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ඇස්තමේන්තු මුදල ( රු.මි. ) | දැනට පවතින තත්ත්වය (2015 නොවැම්බර් දක්වා)(ප්‍රතිශතය) |
|---|---|---|---|---|---|---|
| 01 | EP 01 | 9.55 | නට්පෙට්ටිමුනෙයි පාන්ඩිරිප්පු මායිම් වීදිය | කල්මුණේ | 417.90 | 100 |
| 02 | | | තිරෞපදි අම්මන් කෝවිල් පාර | කල්මුණේ | | 100 |
| 03 | | | සායින්දමරුදු කල්මුනෙයිකුඩි මායිම් වීදිය | කල්මුණේ | | 100 |
| 04 | | | මල්වත්ත සුරිප්පෝඩෙයි වීදිය | සමන්තුරේ | 391.84 | 100 |
| 05 | EP 02 | 9.00 | මනල් හිජිරා වීදිය | පොතුවිල් | | 100 |
| 06 | | | විලිනෙයිඅඩි වීදිය | සමන්තුරේ | | 100 |
| 07 | | | මැද පාර, නින්දවූර් | නිදවූර් | | 100 |
| 08 | | | කාරෙයිතිව් ග්‍රාමීය වීදිය | කාරෙයිතිව් | | 100 |
| 09 | EP 04 | 23.00 | දමන-අම්පලන්ඔය-පන්නලගම වීදිය | දමන | 433.58 | 100 |
| 10 | EP 05 | 9.60 | උප්පුකරච්චි කාදරියා තෝට්ටම් වෙරළ පාර හා දකුණු පාර | අක්කරපත්තුව | 377.13 | 100 |
| 11 | EP 07 | 5.00 | මුදලියාර් වීදිය - අක්කරපත්තුව | අක්කරපත්තුව | 261.14 | 100 |
| 12 | EP 08 | 3.2 | මීරාවෝඩෙයි පිවිසුම් වීදිය | අක්කරපත්තුව | 160.65 | 100 |

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ අබලන් වී ඇති මාර්ග ලෝක බැංකු ආධාර යටතේ ප්‍රතිසංස්කරණය කර ඇත. මේ දක්වා පැකේජ් 06 ක් ඇතුළත සියළුම මාර්ගවල වැඩ අවසන් කර ඇත. මේ තුළින් එම ප්‍රදේශවාසී ජනතාවට සෙතක් සැලසෙන බව සතුටින් දන්වා සිටිමි.

## ඉඩම් හා ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තුව

2015 වර්ෂය වෙනුවෙන් පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සඳහා වූ ප්‍රතිපාදන වශයෙන් මිලියන 83.37 ක් ලැබී ඇත. රුපියල් මිලියන 7.5 ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් හා මිලියන 75.87 ක් පුනරාවර්ථන වියදම් වශයෙන් ද වෙන් කර ඇත.

### ප්‍රාග්ධන වියදම් (මිලියන 5.25)

2015 වර්ෂය තුළදී ප්‍රාග්ධන වියදම් වශයෙන් මිලියන 5.25 ක ප්‍රමාණයක් සඳහා ප්‍රතිපාදන ලැබී ඇති අතර, ඒ යටතේ මිලියන 2.75 ක ප්‍රමාණයක් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ද, ඉතිරි මිලියන 2.5 ක ප්‍රමාණය උපමාන පාදක ප්‍රදාන වියදම් වශයෙන් ද වේ.

### පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (මිලියන 2.75)

| වැය විෂය | 2015 ඇස්තමේන්තුගත මුදල (රුපියල් දහස්) | 2015 වියදම 2015 නොවැම්බර් දක්වා (රුපියල් දහස්) |
|---|---|---|
| ඉඩම් පිලිබඳ ලිපි කටයුතු | 750,000.00 | 721,755.00 |
| ප්‍රදර්ශන නාම පුවරු (රජයේ ඉඩම් පිළිබඳ) | 2,000,000.00 | 1,875,000.00 |
| **එකතුව** | **2,750,000.00** | **2, 596,755.00** |

## උපමාන පාදක ප්‍රදාන (මිලියන 2.5)

| වැය විෂය | 2015 ඇස්තමේන්තුගත මුදල (රුපියල් දහස්) | 2015 වියදම 2015 නොවැම්බර් දක්වා (රුපියල් දහස්) |
|---|---|---|
| වාහන | 2,000,000.00 | 1,743,000.00 |
| කාර්යාල උපකරණ සහ ගෘහ භාණ්ඩ | 500,000.00 | 478,000.00 |
| **එකතුව** | **250,000.00** | **2,221,000.00** |

## ආදායම් ලැබීම

යුදමය වාතාවරණය පැවැති සමයෙහි දෙපාර්තමේන්තුවේ ආදායම් රැස් කිරීම ප්‍රශස්ථ තත්වයෙහි නොපැවතිණි. එහෙත් යුදමය වාතාවරණය අවසන් වීමත් සමඟ ඉඩම් කළමනාකරණ කටයුතු යම් ප්‍රමාණයකට විධිමත් වීම හා ප්‍රාදේශීය මහලේකම් කාර්යාලවල ඉඩම් කළමනාකරණ කටයුතුවල ධාරිතාව පුළුල් වීම නිසා ඉඩම් ආදායම් එක්රැස් කිරීම ඉහළ ගොස් ඇත.

එසේම නව බලපත්‍ර හා දීමනාපත්‍ර නිකුත් කිරීම ඉහළ යාම, නේවාසික කාර්යන් සඳහා දීර්ඝකාලීන බදු මත ඉඩම් ලබාදීම් කටයුතු පුළුල් වීම නිසා මෙම ප්‍රවණතාව ඇති වී ඇති අතර, ඉදිරි වර්ෂවලදී මෙම ආදායම් වැඩිකර ගැනීම සඳහා නව ප්‍රවේශයන් යොදා ගැනීමට බලාපොරොත්තු වේ.

ඒ යටතේ මෙතෙක් ආදායම් අඩු වූ නව විකල්ප ආදායම් මාර්ග වශයෙන්,

1. සන්නිවේදන සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීම වෙනුවෙන් දීර්ඝකාලීන බදු මත අය කිරීම්
2. මාදැල් සඳහා අය කිරීම් ප්‍රවර්ධනය.
3. ඛනිජ ද්‍රව්‍ය වෙනුවෙන් අය කිරීම් ප්‍රවර්ධනය (කළුගල්, වැලි, වැලි ගොඩ කිරීම්)

2015 වර්ෂය තුළදී බදු ආදායම පහළ මට්ටමක පැවතීම සඳහා මුලික ලෙස බලපානු ලැබුවේ, බදුකරුවන් විසින් බදුගෙවීම් පැහැරහැරීම ලෙස පෙන්වා දිය හැකිය. (ඒ සඳහා ඉහළ මට්ටමේ ක්‍රියාමාර්ග සදහා යොමුවී ඇත).

## ආදායම් ලැබීම් විස්තර

| අනු අංකය | වර්ෂය | ත්‍රිකුණාමලය | මඩකලපුව | අම්පාර | එකතුව |
|---|---|---|---|---|---|
| 01 | **2011** | 23,987,866.29 | 5,896,776.69 | 1,6659,155.50 | **31,543,798.48** |
| 02 | **2012** | 112,033.00 | 9,019,791.00 | 742,175.00 | **9,873,999.00** |
| 03 | **2013** | 8,176,816.90 | 3,092,659.65 | 918,875.30 | **13,027,678.85** |
| 04 | **2014** | 47,425,457.72 | 23,455,380.27 | 3,268,551.50 | **53,786,668.87** |
| 05 | **2015** | 6,701,207.20 | 2,031,237.00 | 1,023,751.70 | **9,756,195.90** |
| | **එකතුව** | 86,403,381.11 | 43,495,844.61 | 7,612,509.00 | **137,511,734.72** |

## ඉඩම් කළමනාකරණ කටයුතු

### රන්බිම දීමනාපත්‍ර නිකුත් කිරීම

**2009 වර්ෂයේ සිට වර්තමානය දක්වා සළකා බැලීමේදී රන්බිම දීමනාපත්‍ර සැකසීමේ ක්‍රියාවලිය සීග්‍ර ලෙස සිදුවෙමින් පවතී. පෙර වසර වලට සාපේක්ෂව මෙම වසරේද දීමනාපත්‍ර සකස් කිරීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත දීමනාපත්‍ර 1284 ක් (ත්‍රිකුණාමලය – 219, මඩකලපුව - 625, අම්පාර – 440) යොමුකොට ඇත.**

| අනු අංකය | දිස්ත්‍රික්කය | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 නොවැම්බර් දක්වා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| **1** | ත්‍රිකුණාමලය | 189 | 65 | 106 | 349 | 185 | 219 | 1113 |
| **2** | මඩකලපුව | 184 | 160 | 222 | 675 | 304 | 625 | 2170 |
| **3** | අම්පාර | 193 | 118 | 209 | 598 | 366 | 440 | 1924 |
| | **එකතුව** | **566** | **343** | **537** | **1622** | **855** | **1284** | **5207** |

## ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර (LDO) නිකුත් කිරීම

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ 2015 වර්ෂය තුළදී ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ බලපත්‍ර 2505 ක් ද, අම්පාර දිස්ත්‍රික්කය තුළ 821 ක් ද හා මඩකලපුව දිස්ත්‍රික්කය සඳහා බලපත්‍ර 538 ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කොට ඇත.

| අනු අංකය | දිස්ත්‍රික්කය | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | ත්‍රිකුණාමලය | 118 | 865 | 163 | 188 | 172 | 2505 | 4011 |
| 2 | මඩකලපුව | 193 | 337 | 1917 | 42 | 73 | 667 | 3229 |
| 3 | අම්පාර | 50 | 176 | 42 | 123 | 58 | 947 | 1396 |
| | **එකතුව** | **361** | **1378** | **2122** | **353** | **303** | **4119** | **8636** |

## රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ගකාලීන බදු බලපත්‍ර නිකුත් කිරීම

මේ යටතේ ද 2015 වර්ෂයේ නැගෙනහිර පළාත තුළ බලපත්‍ර දීර්ගකාලීන බදු යටතේ හෙක්ටයාර් 99.9641 ක් ඉඩම් ලබාදී ඇත. ඒ අනුව ව්‍යාපාර සඳහා විශාල ප්‍රමාණයක් බදු බලපත්‍ර ලබාදීමට කටයුතු කර ඇත. තවද කෘෂිකාර්මික කටයුතු සඳහා හෙක්ටයාර් 30 ක ඉඩම් ප්‍රමාණයක් දීර්ගකාලීන බදු යටතේ බලපත්‍ර ලබාදීමට කටයුතු කර ඇත. 2015 වර්ෂයේ නැගෙනහිර පළාත තුළ බලපත්‍ර 294 ක ප්‍රමාණයක් දීර්ගකාලීන බදු බලපත්‍ර යටතේ ලබාදීමට දෙපාර්තමේන්තුව සමත්ව ඇත.

| අනු අංකය | දිස්ත්‍රික්කය | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | ත්‍රිකුණාමලය | 32 | 15 | 10 | 11 | 07 | 32 | 107 |
| 2 | මඩකලපුව | 14 | 12 | 13 | 03 | 07 | 235 | 284 |
| 3 | අම්පාර | 04 | 06 | 14 | 14 | 05 | 27 | 70 |
| | එකතුව | **50** | **33** | **37** | **28** | **19** | **294** | **461** |

## දීමනාපත්‍ර පිළිබඳ කටයුතු (2007/03 චක්‍රලේඛය යටතේ)

**2015 වර්ෂය තුළදී දීමනාපත්‍ර නිවැරදි කිරීම් 36 ක් සිදුකරන ලදි. පෙර වර්ෂයට සාපේක්ෂව ඉහළ ප්‍රතිශතයක් වර්ධනය වී ඇත.**

| අනු අංකය | දිස්ත්‍රික්කය | අවලංගු කිරීම් | නිවැරදි කිරීම් | කොන්දේසි ලිහිල් කිරීම | එකතුව |
|---|---|---|---|---|---|
| **1** | ත්‍රිකුණාමලය | 59 | 15 | 12 | 86 |
| **2** | මඩකලපුව | 69 | 15 | 45 | 129 |
| **3** | අම්පාර | 32 | 06 | 08 | 46 |
| | **එකතුව** | **160** | **36** | **65** | **261** |

## 2015 වර්ෂය තුළදී 2008/04 චක්‍රලේඛය අනුව ලැබුණු අයදුම්පත් හා බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රාදේශීය ලේකම්වරුන්ට අනුමැතිය ලබාදුන් සංඛ්‍යාව

| අනු අංකය | දිස්ත්‍රික්කය | අයදුම්පත් සංඛ්‍යාව | ඉඩම් කච්චේරි සඳහා අවසර ලබාදීම් සංඛ්‍යාව (LDO) | ඉඩම් කච්චේරි සඳහා අවසර ලබාදීමේ සංඛ්‍යාව (SLO) | අනුමැතිය ලබාදුන් සංඛ්‍යාව | LC 144A පෝරම නිකුත් කිරීම් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| **1** | ත්‍රිකුණාමලය | 5290 | 96 | 08 | 74 | 2552 |
| **2** | මඩකලපුව | 22433 | 91 | - | - | 538 |
| **3** | අම්පාර | 994 | 47 | 02 | 03 | 821 |
| | එකතුව | **28717** | **334** | **10** | **77** | **3611** |

## නැගෙනහිර පළාත තුළ ඉඩම් පිළිබඳ ආරවුල් තත්වයන් විසඳීම

**2015 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව මගින් නැගෙනහිර පළාත තුළ ඉඩම් ආරවුල් තත්වයන් 81 සඳහා විසඳුම් ලබාදීමට හැකි විය.**

| අනු අංකය | දිස්ත්‍රික්කය | 2013 | | 2014 | | 2015 | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | පැමිණිලි සංඛ්‍යාව | විසඳුම් සංඛ්‍යාව | පැමිණිලි සංඛ්‍යාව | විසඳුම් සංඛ්‍යාව | පැමිණිලි සංඛ්‍යාව | විසඳුම් සංඛ්‍යාව | පැමිණිලි සංඛ්‍යාව | විසඳුම් සංඛ්‍යාව |
| 1 | ත්‍රිකුණාමලය | 113 | 38 | 158 | 48 | 61 | 28 | 332 | 114 |
| 2 | මඩකලපුව | 119 | 29 | 177 | 38 | 125 | 33 | 421 | 100 |
| 3 | අම්පාර | 85 | 43 | 135 | 70 | 52 | 20 | 272 | 133 |
| | එකතුව | **317** | **110** | **470** | **156** | **238** | **81** | **1025** | **347** |

## රජයේ දෙපාර්තමේන්තුවලට ඉඩම් භාරදීම

**2015 වර්ෂය තුළදී රජයේ දෙපාර්තමේන්තු සඳහා ඉඩම් පවරාදීම් 77 ක් සමස්ත නැගෙනහිර පළාත තුළම සිදුකර ඇත. එහිදී වැඩිම භාරදීම් සංඛ්‍යාවක් මඩකලපුව දිස්ත්‍රික්කය තුළදී සිදුවිය.**

| අනු අංකය | දිස්ත්‍රික්කය | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 (ඔක්තෝම්බර් දක්වා) | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | ත්‍රිකුණාමලය | 07 | 17 | 06 | 29 | 16 | 10 | 85 |
| 2 | මඩකලපුව | 31 | 07 | 04 | 26 | 06 | 50 | 124 |
| 3 | අම්පාර | 12 | 07 | 16 | 83 | 24 | 17 | 159 |
| | එකතුව | **50** | **31** | **26** | **138** | **46** | **77** | **368** |

## රජයේ ඉඩම් පවරාදීම

**2015 වර්ෂය තුළදී නැගෙනහිර පළාත තුළ සමස්ත ඉඩම් පවරාදීම් 25 ක් සිදුකිරීමට ඉඩම් පාලන දෙපාර්තමේන්තුව සමත් වී ඇත. එහිදී ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළදී පැවරීම් 12 ක ප්‍රමාණයක් සිදුකිරීමට හැකිවිය.**

| අනු අංකය | දිස්ත්‍රික්කය | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 (ඔක්තෝම්බර් දක්වා) | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | ත්‍රිකුණාමලය | 01 | - | 03 | 02 | 02 | 12 | 20 |
| 2 | මඩකලපුව | 05 | 01 | 02 | 16 | 01 | 08 | 33 |
| 3 | අම්පාර | 01 | 02 | - | 02 | 08 | 05 | 18 |
| එකතුව | | **07** | **03** | **05** | **20** | **11** | **25** | **71** |

## සුනාමි ව්‍යසනයෙන් විපතට පත්වූ ප්‍රජාව සඳහා නිදහස් දීමනාපත්‍ර නිකුත් කිරීම

**2015 වර්ෂයේ මේ දක්වා කාලසීමාව තුළ ඉඩම් කැබලි 349 ක් පළාත තුළ සුනාමි ව්‍යසනයෙන් විපතට පත් වූ පවුල් සඳහා බෙදා දී ඇත.**

| අනු අංකය | දිස්ත්‍රික්කය | 2008-2011 | 2012 | 2013 | 2014 | 2015 (ඔක්තෝම්බර්) දක්වා | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 1 | ත්‍රිකුණාමලය | - | - | 148 | 111 | 261 | 520 |
| 2 | මඩකලපුව | 2253 | 110 | - | 46 | 00 | 2409 |
| 3 | අම්පාර | 405 | 620 | 160 | 88 | 88 | 1361 |
| එකතුව | | **2658** | **730** | **308** | **245** | **349** | **4290** |

# ජංගම සේවා

නැගෙනහිර පළාත තුළ ඉඩම් පරිපාලනය ක්‍රමවත් කිරීමේ අරමුණින් 2015 වර්ෂය තුළදී අම්පාර, මඩකලපුව හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයන් කේන්ද්‍රකර ගනිමින් ජංගම සේවාවන් 19 ක් පවත්වන ලදී.

| අනු අංකය | දිස්ත්‍රික්කය | ජංගම සේවා ගණන | ලැබුණු පැමිණිලි ප්‍රමාණය | විසඳුම් ලබාදුන් ගණන |
|---|---|---|---|---|
| 1 | ත්‍රිකුණාමලය | 01 | 08 | 07 |
| 2 | මඩකලපුව | 11 | 395 | 315 |
| 3 | අම්පාර | 07 | 411 | 357 |
| | එකතුව | **19** | **814** | **679** |

# මිනින්දෝරු කටයුතු

2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂය තුළදී මිනින්දෝරු කටයුතු පිළිබඳව ප්‍රගතියක් පිළිබිඹු කිරීමට දෙපාර්තමේන්තුවට හැකි විය.

| අනු අංකය | දිස්ත්‍රික්කය | 2014 | | 2015 (ඔක්තෝම්බර්) දක්වා | |
|---|---|---|---|---|---|
| | | අයදුම්පත් ලැබීම් | පිඹුරුපත් නිකුත් කිරීම | අයදුම්පත් ලැබීම් | පිඹුරුපත් නිකුත් කිරීම |
| 1 | ත්‍රිකුණාමලය | 62 | 23 | 51 | 18 |
| 2 | අම්පාර | - | - | 04 | 02 |
| | එකතුව | **62** | **23** | **55** | **20** |

# බිම් සවිය වැඩසටහන

නැගෙනහිර පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 04 ක් තුළ මෙම වැඩසටහන ක්‍රියාත්මක විය. අම්පාර, මන්මුනේ උතුර, නගර හා කඩවත් සහ තඹලගමුව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතරෙහි 2677 කට අධික ඉල්ලුම්පත් සංඛ්‍යාවක් මේ යටතේ ඉදිරිපත්විය.

| අනු අංකය | දිස්ත්‍රික්කය | අයදුම්පත් සංඛ්‍යාව | ඉඩම් කච්චේරිවලින් තෝරාගත් සංඛ්‍යාව | පවත්වන ලද ඉඩම් කච්චේරි සංඛ්‍යාව | නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| **1** | ත්‍රිකුණාමලය | 92 | 06 | 137 | 13 |
| **2** | මඩකලපුව | 2461 | - | - | 363 |
| **3** | අම්පාර | - | - | - | - |
| **4** | තඹලගමුව | 124 | 17 | 116 | 07 |
| | එකතුව | **2677** | **23** | **253** | **383** |

# ප්‍රාග්ධන වියදම හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2016

**2016 වර්ෂය වෙනුවෙන් මෙම අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 398.30 ක් වෙන් කර ඇත. ඒ අනුව උපමාන පාදක ප්‍රදාන යටතේ (CBG) රුපියල් මිලියන 25.0 ක්ද, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) යටතේ රුපියල් මිලියන 373.30 ක්ද මෙම අමාත්‍යාංශයට වෙන් වී ඇත.**

| ක්ෂේත්‍රය | උපමාන පාදක ප්‍රදාන (CBG) (රු.මි.) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) (රු.මි. | එකතුව |
|---|---|---|---|
| අමාත්‍යාංශය | 9.0 | - | 9.0 |
| වනිතා කටයුතු | 3.0. | - | 3.0 |
| ජල සම්පාදන | 3.0 | - | 3.0 |
| නිපුණතා හා මිනිස් බල | 2.0 | - | 2.0 |
| මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව | 6.0 | 371.31 | 377.30 |
| ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව | 2.0 | 2.0 | 4.0 |
| **එකතුව** | **25.0** | **373.30** | **398.30** |

# මාර්ග සංවර්ධන අමාත්‍යාංශය

අප අමාත්‍යාංශය යටතේ සෘජුවම ක්‍රියාත්මක වන වනිතා කටයුතු, නිපුණතා හා මිනිස් බල, ජල සම්පාදන යන අංශවලට හා අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදම් සඳහා උපමාන පාදක ප්‍රදාන යටතේ (CBG) රුපියල් මිලියන 17.0 ක් ද, 2016 වර්ෂය සඳහා වෙන් කර ඇත. මෙය දිස්ත්‍රික්ක තුනටම බෙදී යන සේ වියදම් කරනු ලබන බවද මෙම සභාව ඉදිරියේ දන්වා සිටිමි. ඒ සඳහා වූ සැලසුම් දැනට සකස් කරගෙන යනු ලැබේ.

## • වනිතා කටයුතු

නැගෙනහිර පළාතේ ඇති කාන්තා ගෘහ මූලිකත්වය දරණ පවුල් වලට හා රැකියා නොමැති කාන්තාවන් හඳුනාගෙන ඔවුන්ට ස්වයං රැකියා පුහුණුව ලබා දීම සඳහාත් උපමාන පාදක ප්‍රදාන යටතේ (CBG) රුපියල් මිලියන 3.0 ක් වෙන් කර ඇත.

## • නිපුණතා හා මිනිස් බල

2016 වර්ෂයේ මෙම අංශය සඳහා උපමාන පාදක ප්‍රදාන යටතේ (CBG) රුපියල් මිලියන 2.0 ක් වෙන් කර ඇත.

තවද, මෙයින් රැකියා නොමැති තරුණ තරුණියනට කර්මාන්ත පුහුණු පාඨමාලාවන් ආරම්භ කරනු ලබන බවද මෙම අවස්ථාවේ දන්වා සිටිමි.

## • ජල සම්පාදන

2016 මුදල් වර්ෂය සඳහා ජල සැපයුම් ක්ෂේත්‍රය සඳහා උපමාන පාදක ප්‍රදාන (CBG) යටතේ රුපියල් මිලියන 3.0 ක් වෙන් කර ඇත.

වෙන් කරන ලද මෙම ප්‍රතිපාදන වලින් ආරක්ෂිත පානීය ජලය ලැබී නොමැති ප්‍රතිලාභීන් දිස්ත්‍රික්ක තුනෙන්ම හඳුනාගෙන, ඔවුන්ට අප අමාත්‍යාංශය මගින් පානීය ජල පහසුකම් සලසා දෙනු ලබන බව දන්වා සිටිමි.

# මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව

**2016 මුදල් වර්ෂය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) යටතේ මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 371.30 ක් වෙන් කර ඇත. මෙම ප්‍රතිපාදන ජනගහනය හා භූ විෂමතාවයන් සලකා දිස්ත්‍රික්ක තුනට පහත සඳහන් අයුරින් බෙදා දීමට තීරණය කර ඇති බව මෙම සභාව ඉදිරියේ දන්වා සිටිමි.**

- **අම්පාර - රුපියල් මිලියන 133.67**
- **මඩකලපුව - රුපියල් මිලියන 144.80**
- **ත්‍රිකුණාමලය - රුපියල් මිලියන 92.83**

**මීට අමතරව උපමාන පාදක ප්‍රදාන (CBG) යටතේ රුපියල් මිලියන 6.0 ක්ද වෙන් කරනු ලැබ ඇත.**

**ඉහත මෙම ප්‍රතිපාදන යටතේ සිදුකල යුතු වැඩසටහන් සියල්ල සඳහා මේ වන විට සැලසුම් සකස් කරගෙන යන බවද දන්වා සිටිමි.**

# ඉඩම් හා ඉඩම් පාලන දෙපාර්තමේන්තුව

2016 මුදල් වර්ෂය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) යටතේ ඉඩම් හා ඉඩම් පාලන දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 2.0 ක් වෙන් කර ඇත. මෙම ප්‍රතිපාදන ජනගහනය හා භූ විෂමතාවයන් සලකා දිස්ත්‍රික්ක තුනට පහත සඳහන් අයුරින් බෙදා දීමට තීරණය කර ඇති බව මෙම සභාව ඉදිරියේ දන්වා සිටිමි.

- අම්පාර - රුපියල් මිලියන 0.72
- මඩකලපුව - රුපියල් මිලියන 0.78
- ත්‍රිකුණාමලය - රුපියල් මිලියන 0.50

මීට අමතරව උපමාන පාදක ප්‍රදාන (CBG) යටතේ රුපියල් මිලියන 2.0 ක්ද වෙන් කරනු ලැබ ඇත.

2016 වර්ෂයේ අපේක්ෂිත ක්‍රියාකාරකම් යටතේ මූලික ලෙස පහත සඳහන් වැඩසටහන් සඳහා ප්‍රමුඛතාව ලබාදීමට දෙපාර්තමේන්තුව ක්‍රියාකරනු ඇත.

| අනු අංකය | වැඩසටහන | දිස්ත්‍රික්කය | | | එකතුව |
|---|---|---|---|---|---|
| | | අම්පාර | ත්‍රිකුණාමලය | මඩකලපුව | |
| 1 | රන්බිම ඔප්පු සකස් කිරීම | 200 | 200 | 527 | 927 |
| 2 | දීර්ඝකාලීන බදු ලබාදීම | 50 | 60 | 1026 | 1136 |
| 3 | රජයේ ඉඩම් ආඥා පනත යටතේ දෙපාර්තමේන්තු වල අවශ්‍යතාවලට ඉඩම් ලබාදීම | 6588 | 6000 | 11190 | 23778 |
| 4 | රජයේ ඉඩම් දෙපාර්තමේන්තුවල අවශ්‍යතාවලට ඉඩම් ලබාදීම | 20 | 30 | 89 | 139 |
| 5 | පළාත් පාලන ආයතනවල අවශ්‍යතාවලට ඉඩම් ලබාදීම | 10 | 07 | 51 | 68 |
| 6 | පූජනීය ස්ථානවලට ඔප්පු ලබාදීම | 05 | 10 | 01 | 16 |
| 7 | සුනාමියෙන් අවතැන් වූවන් සඳහා නිදහස් දීමනාපත්‍ර ලබාදීම | 534 | 300 | 00 | 834 |

ගරු සභාපතිතුමනි,

මා විසින් දක්වා ඇති 2015 වර්ෂයට අදාල ව්‍යාපෘති සියල්ල 2014 වර්ෂයේ සකස් කොට 2015 වර්ෂයේ අයවැය යෝජනාවට ඇතුළත් කළ ව්‍යාපෘති හා විදේශ මුලාධාර මත හා මධ්‍යම රජයේ මුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ව්‍යපෘතීන් වේ. ඒ අනුව මෙම අමාත්‍යාංශය හා මෙම අමාත්‍යාංශය යටතේ පාලනය වන දෙපාර්තමේන්තුවලට වෙන්කර ඇති ව්‍යාපෘති ඉතා සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවති.

නැගෙනහිර පළාතේ නව සංවර්ධන පසුබිමක් ඇති කොට, නැගෙනහිර පළාතේ සංවර්ධනයට දායක වූ අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාට මේ අවස්ථාවේ දී මාගේ ප්‍රණාමය පුදකර සිටිමි.

අපගේ අමාත්‍යාංශය යටතේ පවතින සංවර්ධන සැලසුම්වලටත්, ඒවා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමටත් අවශ්‍ය උපදෙස් දීමෙන් සහයෝගය දක්වන නැගෙනහිර පළාතේ ගරු ආණ්ඩුකාර ඔස්ටින් ප්‍රනාන්දු මැතිතුමාටත්, නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය, ගරු හාෆිස් නසීර් අහමඩ් මැතිතුමාටත්, නැගෙනහිර පළාත් සභාවේ ගරු සභාපති ඒ.පී ගලප්පත්තිගේ චන්ද්‍රදාස මැතිතුමන්ටත්, ගරු අමාත්‍යවරුන්ටත්, ගරු විපක්ෂනායකතුමාටත්, නැගෙනහිර පළාත් සභා ගරු මන්ත්‍රීවරුන්ටත්, නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් ඩී. එම්. සරත් අබේගුණවර්ධන මහතාටත්, අප අමාත්‍යාංශයේ ලේකම් ජේ. ජේ. මුරලිදරන් මහත්මියටත්, අනෙකුත් සියළුම අමාත්‍යංශවල ලේකම්වරුන්ටත්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) එස්. කුමරගුරු මහතාටත්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) වී. මහේන්ද්‍රරාජා මහතාටත්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන) ඒ. එච්. එම්. අන්සාර් මහතාටත්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) ඉංජිනේරු කේ. බාස්කරදාසන් මහතාටත්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)

කලාමදි පත්මරාජා මහත්මියටත් හා අමාත්‍යාංශයේ සහකාර ලේකම් ඩී. එම්. ආර්. සී. දසනායක මහතාටත්, ප්‍රධාන ගණකාධිකාරී සී. සුන්දරමූර්ති මහතාටත්, සැලසුම් අධ්‍යක්ෂ අයි. යූ. කේ. සෙනෙවිරත්න මහතාත් ඇතුළු අනෙකුත් නිලධාරී මණ්ඩලයටත්, අප අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තු ප්‍රධානීන් වන මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ ඉංජිනේරු වී. මහින්දන් මහතාටත්, ප්‍රධාන ඉංජිනේරුවරු, විධායක ඉංජිනේරුවරු හා කාර්මික නිලධාරීවරුන්ටත්, ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් එච්. ඊ. එම්. ඩබ්. ජී. දිසානායක මහතාට හා නියෝජ්‍ය කොමසාරිස්වරු, ගණකාධිකාරීවරු ඇතුළු සියළුම නිලධාරීන් වෙත මේ අවස්ථාවේදී මාගේ ස්තුතිය පුදකර සිටිමි.

2016 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති සෑම ව්‍යාපෘතියක්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීමට ඔබ සියළුදෙනාගේම සහයෝගය ලබාදෙන මෙන් ද ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.

ස්තුතියි..!

# ජල සම්පාදන කටයුතු

## ප්‍රතිලාභීන් කිහිපදෙනෙක්........














# නිපුණතා හා මිනිස් බල සංවර්ධනය

## තල් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන සම්බන්ධ පුහුණුව









## මැහුම් පුහුණු වැඩසටහන









## විශේෂ සංවර්ධන වැඩසටහන් (CBG) - ප්‍රතිලාභීන් කිහිපදෙනෙක්..




චක්‍රීය ණය ලබාදීම




ලියාපදිංචි සමිති සඳහා ප්ලාස්ටික් පුටු සහ සෙවිලි තහඩු ලබාදීම




ලියාපදිංචි ගොවි සංවිධාන සඳහා කෘෂිකාර්මික උපකරණ ලබාදීම




පාසැල් සඳහා සංගීත භාණ්ඩ ලබාදීම

# මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව

## 1. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG)



දමන පදගොඩ පල්ලන් ඔය විදිය - අම්පාර



මීරාවෝඩයි, කින්නියඩි පාලම



ධීවර විදිය, කාත්තාන්කුඩි



වන්දාරුමූලෙයි අඩෙයිවු බේක් හවුස් විදිය





කන්තලේ වාන්ඇල පාර

## 2. උපමාන පාදක ප්‍රදාන (CBG)

### මූතූර් ප්‍රදේශයේ ඉදිකරමින් පවතින මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තු උප කාර්යාලයේ ගොඩනැගිල්ල









## 3. මාර්ග නඩත්තු කිරීම (පුනරාවර්තන)- (Recurrent Road Maintenance)



බුද්ධංගල පන්සල පාර - අම්පාර



අතුරු පාර - අම්පාර



රජවැව මාර්ගය ප්‍රතිසංස්කරණ කටයුතු



කට්ටපරිච්චාන් මාර්ගය ප්‍රතිසංස්කරණ කටයුතු



එල්. බී. ඇල පාර - ත්‍රිකුණාමලය



පී. කේ. ටී. පාර



සෙල්වනායකපුර මාර්ගය - ත්‍රිකුණාමලය



වෙන්ඩ්‍රාසන්පුර මාර්ගය ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීම

# 4. ලෝක බැංකු ආධාර

## අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ග











